# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2104/5 - 2018 දෙසැම්බර් මස 31 වැනි සඳුදා - 2018.12.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත

3 වැනි වගන්තිය යටතේ නියෝගය

2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර වන මම, මෙම නියෝගය මගින්, එම වගන්තිය යටතේ, 2016 ජනවාරි මස 01 වැනි දිනැති අංක 1947/45 දරන *අතිවිශේෂ ගැසට් නිවේදනය* මගින් අවසන් වරට සංශෝධිත 2006 ඔක්තෝබර් මස 05 වැනි දිනැති අංක 1465/19 දරන *අතිවිශේෂ ගැසට් නිවේදනය* මගින් ප්‍රකාශයට පත් කරන ලද නියෝගය 2019 ජනවාරි මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මෙහි උපලේඛනයේ දැක්වෙන පරිදි සංශෝධනය කරමි.

2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ පනවන ලද 2018 ඔක්තෝබර් මස 01 වැනි දිනැති අංක 2091/3 දරන *අති විශෙෂ ගැසට් නිවේදනය* මගින් ප්‍රකාශයට පත් කරන ලද නියෝගය 2019 ජනවාරි මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මෙයින් අවලංගු කරමි.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය.

2018 දෙසැම්බර් මස 31 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

### උපලේඛනය

අංක 1465/19 දරන *අතිවිශෙෂ ගැසට් නිවේදනය* මගින් ප්‍රකාශයට පත් කරන ලද උපලේඛනයේ 04 වැනි අයිතමය (සංශෝධිත) වෙනුවට, පහත සඳහන් 04 වැනි අයිතමය ආදේශ කිරීමෙන් තවදුරටත් සංශෝධනය කිරීමෙන් :-

| | | | |
|---|---|---|---|
| "04. | (අ) | මත්පැන් විකිණීමේ නිරත වෙළඳාමක් හෝ ව්‍යාපාරයක් හැර වෙනත් යම් වෙළඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රැකියාවක් කරගෙන යාමට (බලපත්‍රයේ සඳහන්) යම් කාලපරිච්ඡේදයක් සඳහා නිකුත් කළ බලපත්‍රයක් | රු. 2,000.00 හෝ බලපත්‍ර ගාස්තුවෙන් 10% යන මෙවයින් කවර හෝ අඩු මුදල |


1A - PG 4342 — 562 (2019/01)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උපලේඛනය (සම්බන්ධිතයි)*

| | | | |
|---|---|---|---|
| (ආ) | (i) | රට බීම බලපත්‍ර (FL) සමඟ නිකුත් කරනු ලබන AFL1, AFL2, AFL3, AFL4 අරක්කු බලපත්‍ර සහ බෝතල් රා විකිණීම සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර හැර මත්පැන් විකිණීම සඳහා වූ යම් වෙළඳාමක් හෝ ව්‍යාපාරයක් කරගෙන යාමට බලපත්‍රයේ සඳහන් යම් කාලපරිච්ඡේදයක් සඳහා නිකුත් කළ බලපත්‍රයක් | රු. 20,000.00 |
| | (ii) | රට බීම බලපත්‍ර (FL) සමඟ නිකුත් කරනු ලබන AFL1, AFL2, AFL3, AFL4 අරක්කු බලපත්‍ර සහ බෝතල් රා විකිණීම සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර | එක් එක් බලපත්‍රයකට රු. 2,000.00 හෝ බලපත්‍ර ගාස්තුවෙන් 10% යන මේවායින් කවර හෝ වැඩි මුදල" |

01 - 331

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.